Sannasa Sports

රට වෙනුවෙන් උපරිම සේවයක් කිරීම මගේ ලොකුම බලාපොරොත්තුවයි.

- චමින්ද වාස්

මීට වසර දා හතරකට පෙර එනම් 1994 වසරේ ශ්‍රී ලංකා ක්‍රිකට් පිල වෙනුවෙන් ක්‍රීඩා කිරීමේ අවස්ථාව උදාකරගත් වර්ණකුලසූරිය පටබැඳිගේ උසාන්ත ජෝසප් චමින්ද වාස් නම් වන ඔහු නමටම ගැලපෙන ආකාරයේ දීර්ඝ සේවාවක ශ්‍රී ලංකා ක්‍රිකට් වෙනුවෙන් නියැලී සිටියි. තවත් කෙතරම් කාලයක් ශ්‍රී ලංකා පිලට ඔහුගේ විශිෂ්ට සේවාව ලැබේදැයි හරියටම කිව නොහැකි නමුත් මෙතරම් දිගු කාලයක් ආරම්භක පන්දු යවන්නකු ලෙස ශ්‍රී ලංකා ක්‍රිකට් පිලට සේවය කළ ක්‍රීඩකයෙකු අප රෙස්ට් ඉතිහාසයේ නොමැති බව නම් විශ්වාසයෙන් සඳහන් කළ හැකි ය. වසර 27 කි පමණ වූ එම කෙටි ඉතිහාසයේ 1994න් පසු ලබාගත් මොනයම් හෝ ජයග්‍රහණයක් ඇත්නම් ඒ සඳහා වාස් ගේ වාසිය නොමඳව කැපී පෙනෙන්නට තිබුණි. විශේෂයෙන් මුරලි වාස් සංයෝජන ගිනිකාවට දමනය නොවූ කණ්ඩායමක් සොයාගත නොහැකි ය. ශ්‍රී ලංකා පිතිකරුවන්ගෙ පිති හරඹ ස්ථාවර මට්ටමකැතුබා ගැනීමට නොහැකි වීම නිසා නොවන්නම් සියලු බාධා කම් කටොලු මැද වුවත් අප පවුබමේ ක්‍රිකට් ඉදිරියෙන් තැබීමට වාස් කළ සේවය මෙසමේ එඩා කැපී පෙනෙණු ඇත.

කෙසේ නමුදු එක්දින හා ටෙස්ට් ක්‍රිකට් කුඩුලු 400 යේ සීමාවට ළඟාවෙමින් සිටින වාස් පන්දු යවන්නකු ලෙස හැඳින්වීමට වඩා නිවැරදි විනිනේ තුන් ඉරියව්වේම කැපී පෙනෙන ක්‍රීඩකයකු ලෙස හැඳින්වීමයි. ටෙස්ට් ක්‍රිකට් ශතකයක් සමග ලකුණු 24 ක සාමාන්‍යයක් රඳවාගෙන ඇති වාස් පන්දු රැකීමට ද එක සේ දක්ෂමි දක්වන බව ක්‍රීඩා ලෝලීන්ට නොරහසකි. ප්‍රවීණ ක්‍රිකට් විචාරකයන් පවසන්නේ ආරම්භක පන්දු යවන්නකු සතු ව තිබිය යුතු සියලුම අවි වාස්ගේ අවි ගබඩාවේ දක්නට ලැබෙන බවයි.

ශ්‍රී ලංකා ක්‍රිකට් පිලට අමතරව ලෝකයේ ප්‍රධාන පෙලේ ක්‍රිකට් ක්‍රීඩා සමාජ කීපයක්ම නියෝජනය කර ඇති වාස් දැනට ඉන්දියාවේ පැවැත්වෙන අයිපීඑල් තරගාවලියේ හයිදුබාද් හි ඇජ්ජ ස්ස්රොරැ්ි කණ්ඩායම නියෝජනය කරමින් සිටියි. එම තරගාවලියේ තරගයකට සහභාගි වීමට පෙර පුහුණුවීම් කරන අවස්ථාවේදී ලැබුණු කෙටි විරාමය තුළ දී 'සන්නස' ක්‍රීඩා ලෝලීන් වෙනුවෙන් පිළිසඳරක යෙදෙන්නට ඔහු දැක්වූ කැමැත්ත හා නිහතමානිත්වය ඉතා ඝෘතවේදීව සඳහන් කළ යුතුම ය. ඔහුගේ ක්‍රීඩා දිවිය මෙතරම් සාර්ථක දිගු ගමනක යෙදෙන්නට එවැනි ගුණාංග මහත් රැකුලක් වන්නට ඇතියි මම සිතමි.

සන්නස

ඔබ සහභාගි වන අයිපීඑල් තරගාවලිය ගැන ඔබේ අදහස කුමක් ද?

වාස්

මෙම තරගාවලිය ඉතාමත්ම හොඳින් සංවිධානය කර ඇති බව පේනවා. අනාගතේදී මෙවැනි තරගාවලි ඉතා ජනප්‍රිය හා සාර්ථක වේ යයි මම හිතනවා. කෙටි කාලයක් තුළ ක්‍රීඩා ලෝලීන්ට උපරිම ආස්වාදයක් හා වින්දනයක් ලැබීම ඊට හේතුවෙනවා. පාපන්දු ක්‍රීඩාව ලොව ජනප්‍රියම ක්‍රීඩාව බවට පත්ව ඇත්තේ ඒ නිසයි. අයිසීසී එක අඩුපාඩු සොයා බලා දියුණු කළ යුතුයි. අනාගතයේදී පාපන්දු තරමටම ජනප්‍රිය ක්‍රීඩාවක් බවට ක්‍රිකට් ගෙන ඒමට ඔවුන්ට හැකි වේවායි මම ප්‍රාර්ථනා කරනවා. ඒ හැරුණා කොට ක්‍රීඩකයන්ගේ උපරිම දක්ෂතා දක්වන කාලය තුළ තම මවුබිම වෙනුවෙන් ක්‍රීඩා කිරීමට අවස්ථාවක් නොලැබෙන ක්‍රීඩකයන්ට මෙවැනි තරගාවලියක් තුළින් අවස්ථා උදාවෙනවා. ඉතා මහන්සියෙන් හා කැපකිරීමකින් කුසලතා දියුණු කරගන්නා ක්‍රීඩකයන්ම හොඳ ආර්ථික පසුබිමක් සකස් කර ගැනීමට මෙවැනි තරගාවලි උපකාරී වෙනවා. ක්‍රීඩා ලෝලීන් ඉතාත් කැමැත්තක් දක්වන ප්‍රතාරාත්මක පිති හරඹ මෙම තරගාවලිය තුළින් දැක ගත හැකියි. කණ්ඩායම් වශයෙන් වෙන් වෙන්ව තම රට වෙනුවෙන් ක්‍රීඩා කළ ක්‍රීඩකයන් විජාතික ක්‍රීඩකයන් සමග එකම කණ්ඩායමකට එක්වී සුහදව සහයෝගයෙන් ක්‍රීඩා කරණු දැකීමත් ක්‍රීඩා ලෝලීන්ට නැවුම් ආශ්වාදයක් ගෙන දෙන්නක්.

සන්නස

ඔබෙන් පසු ශ්‍රී ලංකා පිලේ ආරම්භක පන්දු යවන්නකු ලෙස දිගු ගමනක් යා හැකි ක්‍රීඩකයන් ලෙස ඔබ දකින්නේ කවුද?

වාස්

ශ්‍රී ලංකාවේ තරුණ ක්‍රීඩකයන් බොහෝ දෙනෙක් ඉන්නවා. ඒත් ඒ අය හොඳින් පුහුණුවීම් කර ශරීර සමබරතාව හා ශාරීරික ආබාධ අවම කරගනිමින් ඉදිරියට යායුතුයි. ඒ සඳහා හොඳ විනයක් අවශ්‍ය වෙනවා. එහෙම උනොත් පමණයි ආරම්භක වේග පන්දු යවන්නකුට දිගු කාලයක් කණ්ඩායමක රැඳී සිටින්නට හැකි වෙන්නෙ. දැනට මහරුත් හා මාලිංග වැනි ක්‍රීඩකයන් කපවීමකින් ඉදිරියට එන බව පෙනෙන්නට තියෙනවා.

සන්නස

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මූල්‍ය අර්බුදයකට මුහුණ පා ඇති බව අසන්නට ලැබෙනවා. හැමදාමත් මොකක් හෝ අර්බුදයක් අසන්නට ලැබෙනවා.

වාස්

මම හිතන විදිහය ක්‍රිකට් ක්‍රීඩාව හා එහි පරිපාලනය ගැන හොඳ අවබෝධයක් තිබෙන අර්ජුන රණතුංග එහි පාලනය බාරගෙන ඇති නිසා ඉදිරියේ දී එම අර්බුද වලින් ශ්‍රී ලංකාවේ ක්‍රිකට් හොඳ මගකට ඒ යයි බලාපොරොත්තු වෙන්න පුලුවන්.

සන්නස

අපේ රටේ ක්‍රිකට් දියුණු කිරීමට විශේෂයෙන් කල යුතු යමක් ඔබ දකිනවා ද?

වාස්

පාසල් ක්‍රිකට් දියුණු කිරීම ඉතාමත්ම වැදගත් දෙයක් ලෙස මම දකිනවා. ඒ වගේම ප්‍රාන්ත ක්‍රිකට් ක්‍රීඩාවත් අතිවාර්යයෙන්ම දියුණු කළ යුතුයි. එමගින් අඩුම තරමින් කණ්ඩායම් පහකින් හොඳ ක්‍රීඩකයන් 75 ක් වත් හඳුණාගැනීමට හැකියාවක් ලැබෙනවා.

සන්නස

ඔබේ අනාගත බලාපොරොත්තු මොනවාද?

වාස්

රට වෙනුවෙන් උපරිම සේවයක් කිරීම මගේ ලොකුම බාලාපොරොත්තුවයි. එක්දින කඩුලු 400ක් ලබාගැනීමට ආසන්නව සිටිනවා. ටෙස්ට් කඩුලු 400 යේ සීමාව කරා ගන්නත් කැමැත්තක් තිබෙනවා. ක්‍රිකට් ක්‍රීඩාවෙන් සමුගත් පසු කුමක් කළ යුතු ද කියා හරියටම තීරණයක් ගෙන නැති නමුත් මා සේවය කරන බැංකු සමාගමට වසර කීපයක් සේවය කිරීමට බලාපොරොත්තු වෙනවා.

සන්නස

ඔබේ පවුලෙන් ඔබට විශාල සහයක් ලැබෙනවා. ඒ අය ගැන යමක් දැනගන්න අපේ පාඨකයන් කැමති වෙයි.

වාස්

මගේ බිරිඳ වාසනා මගේ ක්‍රීඩා දිවියට හොඳ සහයෝගයක් දෙමින් මගේ සෙවණැල්ල මෙන් මා සමග ඉන්නවා. අපට දින කීපයක් වයසැති පුතෙක්ද සිටිනවා. තාම නමක් තිබ්බෙත් නෑ. ලොකු දුව නේනා අවුරුදු 6 ක් හා පුතා අශ්වින් අවුරුදු 3 ක් වයසයි.

සන්නස

අවසන් වශයෙන් ඔබේ සියලුම බලාපොරොත්තු ඉටුවේවායි ප්‍රාර්ථනා කරන අතර දෙවියන් වහන්සේ ඔබට එක් වරමක් දෙන්න කැමති නම් ඔබ ඉල්ලන්නේ කුමක්දැයි කියන්න පුලුවන් ද?

වාස්

මා මගේ පපවුලේ දියුණුව ක්‍රීඩාවේ දියුණුව වගේ දෙයක් ඉල්ලන්න කැමති වුණත් ඒ සියල්ලට වඩා වැදගත් වන දෙයක් ඉල්ලන්න කැමතියි. අද මුලු ලෝකයටම සාමය අවශ්‍ය වෙලා තිබෙනවා. ලෝකයට සාමය ලබා දෙන ලෙස මා දෙවියන් වහන්සේගෙන් ඉල්ලා සිටිනවා. ඒ තුළින් ලොව බොහෝ දෙනෙකුගේ බලාපොරොත්තු ඉටු වේවි.

සාකච්ඡා කර ලිව්වේ

අසෝක සිල්වා

දැග පන්දුව

ඔලිම්පික් සංවිධයේ පුහුණුකරු ලෙස ඩර්වින් වෙනුවට මර්වින්

- පංචුකගේ යෝජනා මෙන්න

මොකද පන්දුක බකංතිලාගෙන අහස පොළොව ගැටලන්න පැළෙනක් ගහගවද? එහෙමත් නැත්නම් තමුසෙ කිරිකට් වලින් ලෙඩක් වතා දාගත්ත ද?

නෑ නෑ ජගිරි මහත්තයා. ඔලිම්පික් එකත් ලග ලගම එනවනේ..

ඉතින් තමුසෙත් මොකක් හරි ඉවෙන්ට් එකක් කරන්න ද යන්නෙ..?

බැරි කමක් නෑ ජගිරි මහත්තයෝ.. හරි පුහුණුකාරයෙක් හොයා ගත්තොත් .. ඒක නෙවෙයි මං කල්පනා කළේ.. කටටම තියලා ජාති නංගින් ලෙඩක් දාගත්තනෙ..

කවුද ජාති කිව්වෙ..?

අයියෝ දන්නෑද්ද..? ජාති වතුරංගනී. .. අර මීටර් 100 රන් පදක්කම ගත්ත නගා. එයා ඔලිම්පික් එක කටටම තියලනෙ ලෙඩේ දාගත්තෙ .

මොන පදක්කම් ගත්තත් මොකටද මන්ද්‍රව්‍ය වෝදනා වලට වැරදිකාරයො වෙලා. ඒක රටටත් අවනම්බුවක්නෙ.

එහෙම කියන්න එපා ජගිරි මහත්තයා.. රට යන විදියටම තමයි ජාති නගාත් ගිහිල්ලා තියෙන්නේ.. මත් ද්‍රව්‍ය වලට අපේ රටේ කොයි තරම් නම් තැනක් තියෙනව ද? මොකක් හරි කරලා කෙල්ලව බේර ගන්න ඕනෙ.. අපේ 'ලොකු' ලේසියෙන් අරින්නෙ නැහැ මේක.

මට තේරෙන්නෙ නෑ බං ඕවා.. කවුද ලොකු කිව්වෙ?

ලොකු කිව්වෙ අපේ කිරිඩා ඇමතිතුමා.. එතුමා අපේ ජාතිගෙ තහනම ඉවත්කරන්න කියලා කට්ටියක් සුවිසර්ලන්තයට යවලා... අපරාදෙ කියන්න බෑ දැනටමත් මිලියන පහක් හයක් වියදම් කරලා තියෙන්නෙ මේ වැඩේට.

අනේ අම්මපා ඇත්තඳ පංචුක.. ලොකු බැලුවම මහ දානපතියෙක්නෙ.. එතුමගේ ධනය වියදම් කරලා රටට පදක්කම් අරන් දෙන්න හදන එක මොන තරම් හොඳ ආදර්ශයක ද අපේ අටේ සල්ලිය බාගෙ උතුරන්න තියෙන ධනවතුන්ට..

නෑ නෑ ජගිරි මහත්තයා.. ලොකුගෙ සල්ලි නෙවෙයි.. ආණ්ඩුවෙ සල්ලි..

මොනව... මහජන මුදල්.. ඔය වෙලාවට තමයි ඉතින් ගගේ මාලු මගේ ඇගේ නටන්නෙ.. ජාත්‍යන්තර මන්ද්‍රව්‍ය එකෙන් ප්‍රර්යේෂණ කරලා ගත්ත තීන්දුව වෙනස් කරන්න මහජන මුදල් නාස්තිකරනවට වඩා හරකඳ අනිත් අයටත් ආදර්ශයක් පාඩමක් ඉගෙන ගන්න ඒ වරදට සම්බන්ධ වෙච්චි අනිත් අයවත් හොයලා දඬුවම් කරන එක. කවුද ජානිගෙ පුහුනු කාරයා. ඩාර්වින් ලොක්කා නේද? මං ඇමති නං නම් එයාවත් තහනම් කරනවා.

ඒක නම් ඇත්ත .. මත් ද්‍රව්‍ය උගත් අනු නොවෙන්න ගන්න හැටි පුහුණු කරු දැනගෙන ඉන්න එපා යැ.. නේද..?

මේ කතා බහට හොරෙන් කන්දෙමින් අසළ මේසයක කුරුටු ගාමින් සිටි සංක්‍රමනික මහත්තයා මඳ කිපුනු ඇසෙකු මෙන් අපේ සාකච්ඡාවට කඩා පැන්නේ කෙදිනකවත් නොදුටු තරම් කේන්තියකිනි.

උඹට ඔල්මාදෙද..? මොනවද ඔය කියන්නෙ..? හරියට පාවිච්චි කළත් වැරදියට පාවිච්චි කළත් මන්ද්‍රව්‍ය මත් ද්‍රව්‍යම තමයි..

කේන්ති නොගෙන මං කියන දේත් අහන්නකො සංක්‍රමණික මහත්තයා... දැන් බලන්නකො ඔය පවුඩර් (කුඩු) ලාල් ලා එහෙම රටට කොයි තරම් ජයග්‍රහණ අරන් දෙනව ද? රටේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්න.. ඒ වගේම රටේ ප්‍රධාන ආයතන වල වැරදි කරන ගිලධාරීන් යහ මගට යවන්න රථපුරා පොලිසි වලට අවහිරයක් නොවෙන පරිදි අවුසඳ බෙදා හරින්නී ඔය වගේ කොයි තරම් දේවල් කරල තියෙනව ද මේ රට වෙනුවෙන්..

ඒ කිව්වෙ..?

ඒ කිව්වෙ ජගිරි මහත්තයා බලන්න නැගෙ නහිර මොන ජගතටද පුලුවන් සාදාරණ ජන්දයක් තියන්න පවුඩර් ලාල්ලා නැතිව. එස්ටීඑෆ් එකටවත් බෑ.. රූපවාහිනියෙ එහෙම සර්ව සාදාරණ සුවාදීන පුවත් කියන්නැති ගිලදාරීන් මට්ටු කරන්න කාටද පුලුවන් පවුඩර්ලට ඇර... ඒ විතරක් ද... ලෝකෙ වැඩිපුරම ඔලිම්පික් රන් පදක්කම් දිනපු රට රුසියාවත් පරද්දයි.. ඒ ගොල්ලන්ට අයිති අගනුවර අක්කර පහක ඉඩමක් අල්ලගෙන රටේ දුප්පත් ජනතාවට කාර් පාක් හැදුවෙ කවුද? පවුඩර්ල නෙවෙයි ද? මේ පවුඩර්ලව ක්‍රමානුකූලව පුහුණු කරල තියන නිසායි ඔය තරම් කප් ගහන්න පුලුවන් උනේ.. ඒක තමයි මං කියන්නෙ මත් ද්‍රව්‍ය වල වරද නෙවෙයි.. පුහුණුවෙ වරදයි මෙතන තියෙන්නෙ...

ඉතින් කවුද ඔය පවුඩර්ලව ඔය තරම් හොඳට පුහුණු කරලා තියෙන්නෙ?

වෙනින් කවුරුවත් නෙවෙයි.. මර්වින්.. ඒකයි

මම යෝජනා කරන්නෙ ලොකුට මේ සැරේ ඔලිම්පික් කණ්ඩායම ඩර්වින් ලොක්ක යටතේ පුහුණු කරලා කවදාවත් පදක්කම් ගන්න ලැබෙන්නෙ නෑ කියලා.. වහාම ක්‍රියාත්මක වන පරිදි ඩර්වින් අයින් කරලා මර්වින් ට ඒ තනතුර දෙන්නම ඕනෙ..

සංක්‍රමණ මහත්තයයි ජගිරි මහත්තයයි කුටු කුටු ගාමින් නොකියාම පල්ලම් බැස්සේ වෙනදා මෙන් 'යන්නම් පංචුක' වත් නොකියා ය. අනේ මේ මහත්තුරුන්ට මට පේන මේ පරම සත්‍යය තේරුම් ගන්න බැරි හැටියක්..

පංචුක බිලිංකම